# පවුල් සැලසුම් උපදේශන සැනපත් කට්ටල භාවිතය සඳහා සේවා සපයන්නන්ට උපදෙස්.




මෙම සැනපත් කට්ටලය සිත් බඳනා අයුරින් ඉතා පැහැදිලිව නිමාකර පොතක ආකාරයට අමුණා ඇත.





- සැනපත් කට්ටලය භාවිතයේ ප්‍රධානම අරමුණ වන්නේ පවුල් සැලසුම් උපදේශන සේවා සැපයීමේදී මෙය උපයෝගි කොට සේවාලාභියා දැනුවත් කිරීම හා කැමති උපත් පාලන ක්‍රමයක් භාවිතය සඳහා ස්වාධීන තීරණයක් ගැනීමට ඉඩ සැලසීමයි.

- වඩාත් කැමති පවුල් සංවිධාන ක්‍රමයක් තෝරාගෙන එය භාවිතා කිරීම සේවාලාභියාට සැපවත් නිරෝගී දිවිපෙවෙතකට මං සලසනු ඇත.

- මෙම සැනපත් විස්තර කරන විට අදාල පවුල් සංවිධාන උපකරණද (ගිලින පෙති පැකැට්ටුවක්, අන්තර් ගර්භාෂිත තැන්පතුව, නික්ෂේපණ වයලයක් සහ කොන්ඩම් වැනි) ඔබ ළග තබාගෙන අවශ්‍ය අවස්ථාවලදී සේවාලාභියාට දැක ගැනීමට සැලැස්වීමෙන් උපදේශනය වඩාත් සාර්ථක වනු ඇත.

**<u>පහත කණ්ඩායම් සඳහා උපදේශන සේවා සැපයීමේදී ඔබට මෙම සැනපත් ප්‍රයෝජනයට ගත හැක.</u>**

01. ලිංගික සංසර්ගයේ යෙදෙන යුවලවල් හා පුද්ගලයින් සඳහා (විවාහක, අවිවාහක)
02. යෝග්‍යතා පවුලක් ප.සෞ.සේ.නි. විසින් ලියාපදිංචි කළ විගසම
03. දරු පිළිසිඳ ගැනීමකට පෙර හා පසුව
04. දරු ප්‍රසූතියෙන් පසු මව්වරුන් සඳහා (සති 6 කට පසුව)
05. පහත සායන වලට සහභාගි වන සේවාලාභියන් සඳහා
    a. පූර්ව ප්‍රසව සායනය
    b. පසු ප්‍රසව සායනය
    c. පවුල් සංවිධාන සායනය
    d. සුවනාරි සායනය